**ශීර්ෂය 310 - රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 310 -රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 ජූනි 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 25 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) දේපළ පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වත්කම් හඳුනා ගැනීමේ කේතාංක ඇතුලත් කර නොතිබීම හේතුවෙන් සිගාස් මගින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර වත්කම් වාර්තාවෙහි භාණ්ඩ සමීක්ෂණ වාර්තාවන්හි පවත්නා වත්කම් පමණක්ම ඇතුළත්ද, වත්කම් අපහරනයන්හිදී කුමන වත්කම් ඉවත් කර තිබේද, කුමන වත්කම් දෙපාර්තමේන්තුව තුල පවතින්නේද යන්න හඳුනා ගැනීමට විගණනයට නොහැකි විය. එමෙන්ම මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන රු.1,009,227,853 ක් වටිනා වත්කම් සත්‍ය වශයෙන්ම දෙපාර්තමේන්තුව තුල භෞතිකව පවත්නා වත්කම් පමණක් බව තහවුරු නොවීය. | සිගාස් වෙත ඇතුලත් කර ඇති වත්කම් සඳහා කේතාංක ඇතුලත් කිරීම කමිටුවක් හරහා සිදුකොට සිගාස් මඟින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර වත්කම් හා ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් පවතී. | ගිණුම්ගතකර තිබෙන භාණ්ඩ සත්‍ය වශයෙන්ම භෞතිකව පවතින නිවැරදි භාණ්ඩ ප්‍රමාණය බව තහවුරු කර ගත යුතු බව. |

**(ආ) ගබඩා අත්තිකාරම් ගිණුම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | මු.රෙ 501 ප්‍රකාරව ගබඩා අත්තිකාරම් ගිණුම් පවත්වාගනු ලබන්නේ ලාභ උපයන අදහසින් හෝ පාඩු අපේක්ෂාවෙන් නොවන අතර, භාණ්ඩ ගෙන එනු ලබන මිළට භාණ්ඩ තොගය ගණන් ගනු ලබයි. එසේ වුවද භාණ්ඩ මිළදී ගැනීමට, ගබඩා කිරීමට හා මෙහෙයුම් කටයුතු සඳහා වන වියදම් ආවරණය වන පරිදි පිරිවැයට සියයට 10 ක් මුල් මාස 06 සඳහා ද ,සියයට 8 ක් අග මාස 06 සඳහාද එකතුකර තොග නිකුත් කරනු ලබන බව 2023 ගබඩා අත්තිකාරම් ගිණුමේ පෙරවදනෙහි දක්වා තිබුණි.මේ හේතුවෙන් නිකුත් කිරීම් පිරිවැය හා අනෙකුත් සේවක හා සැපයුම් වියදම් අඩුකල පසු රු.5,437,455ක අතිරික්තයක් (දළ වියදම් ඉක්මවූ නිකුත් කිරීම්) ගිණුමෙහි පෙන්නුම් කරයි. | ප්‍රධාන ගබඩාවේ සේවක වියදම හා සැපයුම් වියදම් ආවරණය සඳහා නිකුත් කිරීම්වලට යම් ප්‍රතිශතයක් එකතු කරනු ලැබේ. (MOH රේටයක්) මෙහි ලාභය හෝ අලාභය මූලික වශයෙන් තීරණය වනුයේ වසරේ නිකුත් කිරීම් මතය. 2022 වසරේ මිලියන 19ක ලාභයක් පැවති බැවින් MOH රේටය 8% දක්වා 2023 වසරේ අඩු කරන ලදී.වසරේ නිකුත් කිරීම් සලකා බලා MOH අගය වෙනස් කල යුතු නම් කමිටුවක් මඟින් එය වෙනස් කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| ii | සමාලෝචිත වර්ෂයේ ගබඩා අත්තිකාරම් ගිණුමෙන් කළ වැඩ අත්තිකාරම් ගිණුමට නිකුත් කල ද්‍රව්‍යවල පිරිවැය රු.111,541,429 ක් වූ අතර මෙම නිකුත්කිරීම්වල ගණනය කරන ලද වටිනාකම රු.127,685,080 ක් වී තිබුණි. මේ අනුව ගබඩා කිරීම් හා මෙහෙයුම් කටයුතු සඳහා වන වියදම් ආවරණය සඳහා රු.16,143,651 ක අගයක් එකතුකර තිබුණි. ඒ අනුව එම අගය නිකුත් කිරීම්වල පිරිවැයෙන් සියයට 14.5 ක ප්‍රමාණයක් බවද නිරීක්ෂණය විය. | සමාලෝචිත වර්ෂයේ නිකුත් කල ද්‍රව්‍ය පිරිවැය රු.111,541,429ක් වූ අතර, ශුද්ධ නිකුත් කිරීම් රු. 127,685,080ක් විය. එබැවින් වියදම ඉක්මවූ දළ නිකුත් කිරීම් 16,143,651ක් වූ අතර එම අගය නිකුත් කිරීම් පිරිවැයෙන් 14.5 සියයට ක ප්‍රමාණයක් විය. ඉන් රු.10,706,195ක සේවක වියදම් හා සැපයුම් වියදම් ඉක්මවූ නිකුත් කිරීම් රු.5,437,455ක් වූ අතර එය නිකුත් කිරීම් පිරිවැයෙන් සියයට 4.8ක් බව දන්වමි. | පෙරවදනෙහි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**(ඇ) කල වැඩ අත්තිකාරම් ගිණුම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | සමාලෝචිත වර්ෂයේ ගබඩා අත්තිකාරම් ගිණුමෙහි අතිරික්තය වූ රු.5,437,456 ක් කළ වැඩ අත්තිකාරම් ගිණුමට අනුචිත ලෙස ගලපා තිබුණි. මේ හේතුවෙන් නිෂ්පාදන පිරිවැය රු.5,437,456 කින් අඩුවෙන් දක්වා ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. එබැවින් 2023 වර්ෂයේදී කලවැඩ අත්තිකාරම් ගිණුමෙහි දක්වා ඇති රු.5,377,653 ක් වූ අලාභය, එම ගැලපුම සිදුකර නොතිබුණි නම් රු.10,815,109 ක අලාභයක් දක්වා වැඩි වීමට හේතුවේ. මීට අමතරව ගබඩා අත්තිකාරම් ගිණුමට අදාල සේවක අතිකාල, බටා හා ප්‍රවාහන වියදම් එකතුව රු.10,706,195 ක්ද නිෂ්පාදන පිරිවැය ගණනයේදී අඩුකර තිබුණි. මේ තත්ත්වයද සලකා බැලීමේදී අලාභය එම අගයෙන් ද වැඩි වනු ඇති බවද නිරීක්ෂණය වේ. ඒ අනුව කළ වැඩ අත්තිකාරම් ගිණුමේ මුළු අලාභය රු. 21,521,304ක් වන බව නිරීක්ෂණය විය. | පවතින අඩුපාඩු නිවැරදි කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. එමෙන්ම, 8001,8002 වැඩපත් යටතේ වැඩ සඳහා යොදවාගනු ලබන සේවකයන් හට වැටුප් ගෙවනු ලබන්නේ කළවැඩ අත්තිකාරම් ගිණුම යටතේ වන නමුත් අදාල වියදම සත්‍ය වශයෙන්ම අදාල වන්නේ ගබඩා අත්තිකාරම් ගිණුමේ වියදම් යටතේය. එබැවින් ගබඩා අත්තිකාරම් ගිණුමට වියදමක් කර කළවැඩ අත්තිකාරම් ගිණුමට වැය බරක් කර ඇති වියදම ඉවත් කිරීමක් මෙහිදී සිදුකෙරේ. | ගබඩා අත්තිකාරම් ගිණුමෙහි අතිරික්තයන් කල වැඩ අත්තිකාරම් ගිණුමෙහි නොගැලපිය යුතු බව. |

| | | | |
|---|---|---|---|
| ii. | 2023 වර්ෂයේ විකුණුම් ලෙස රු.243,243,793 ක් මූල්‍ය ප්‍රකාශයන්හි දක්වා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | | |
| | • ගිණුම් ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රකාශයේ ආදායම් හඳුනා ගැනීම සම්බන්ධයෙන් දක්වා ඇති ප්‍රතිපත්තියට පටහැනිව විකුණුම් ඉන්වොයිස් ලැයිස්තුවේ කලවැඩ ඉන්වොයිස් අගය ලෙස දක්වා තිබුණේ සත්‍ය වියදම නොව ඊට වඩා වැඩි අගයක් වූ මුළු ඇස්තමේන්තුගත වටිනාකම වේ. තවද **2023** දෙසැම්බර් **31** දිනට නිමකොට නොතිබුණු වැඩ පත්‍රිකා වෙනුවෙන් ඉන්වොයිස් ඉදිරිපත්කරණයට විකුණුම් ලෙසත් ණයගැතියන් ලෙසත් ගිණුම්ගත කිරීමෙන් විකුණුම් වටිනාකම හා ණයගැතියන් වැඩි අගයකට ගිණුම්ගත කර තිබුණි. | පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් නිම කරන ලද කාර්යයන් සඳහා, අදාල නිම කරන ලද වැඩවල වටිනාකමට පමණක් ඉන්වොයිස් පත් නිකුත් කිරීම සාමාන්‍ය ක්‍රමය වන අතර, පාරිභෝගික ඉල්ලීම මත එම ආයතන වලින් අප වෙත ගෙවීම් කිරීමේ ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා, එම ආයතන වල ඉල්ලීම මත, ඇතැම් අවස්ථාවල ඉන්වොයිස් පත් නිකුත් කරනු ලැබේ. | ගිණුම් ප්‍රතිපත්තිය ප්‍රකාරව නිමකරන ලද වැඩවල වටිනාකමට ඉන්වොයිස්පත් නිකුත් කල යුතුබව. |
| | • වැඩපත්වල සත්‍ය වියදම වැඩපතෙහි ඇස්තමේන්තුගත අගයට වඩා වැඩි අගයක් ගෙන තිබූ අවස්ථා නිරීක්ෂණය වූ අතර මේ හේතුවෙන් වියදම් දරා තිබුණද එම වියදම ඉන්වොයිස්ගත කර නොතිබීමෙන් සත්‍ය වියදම් වූ මුදල අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | මෙහිදී අදාල මුදල පාරිභෝගික ආයතනය මගින් අයකර ගැනීමට සාධාරණ හේතු හා අවස්ථා පවතින අවස්ථා වලදී, පාරිභෝගික ආයතනයට අමතර ඇස්තමේන්තුවක් යොමුකර ඒ සඳහා අනුමැතිය ලබාගැනීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම් ප්‍රතිපත්තිය ප්‍රකාරව නිමකරන ලද වැඩවල වටිනාකමට ඉන්වොයිස්පත් නිකුත් කල යුතුබව. |
| iii. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 102 ඡේදය ප්‍රකාරව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශන මුහුණතෙහි රේඛිය අයිතම ඇතුලත් කල යුතු වුවද ලී බඩු ක්ෂය සෘජුව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුලත් කර තිබුණි. | 2024 ගිණුම් සැකසීමේදී මෙම අගය පරිපාලන වියදම් තුල ඇතුලත් කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කල යුතුබව. |
| iv. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 හි 54 ඡේදය ප්‍රකාරව අස්තිත්වයක් විසින් පෙර කාලපරිච්ඡේද වැරදි සම්බන්ධයෙන් වරදෙහි ස්වභාවය, හැකිතාක් දුරට මූල්‍ය ප්‍රකාශන වල රේඛිය අයිතමයන් සඳහා නිවැරදි කල යුතු මුදල, ඉදිරිපත් කර ඇති පැරණිතම පෙර කාලපරිච්ඡේදය ආරම්භයේ නිවැරදි කරන ප්‍රමාණය සහ අතීතානුයෝගී නැවත ප්‍රකාශ කිරීම | 2022 වර්ෂයේදී මුද්දර බදු හා වැට් අගය ලෙස ඉවත් කරන ලද ශේෂයන් සඳහා 2023 වර්ෂයේදී මුදල් ලැබීම්, ඉන්වොයිස් අවලංගු වීම්, පෙර වර්ෂයන්හී තොග නිකුත් කිරීමේ පිරිවැය නිවැරදි කිරීම්, ණයගැතියන්ගේ ලැබීම් නිවැරදි කිරීම් හා කාරක පාඩුව පියවා ගැනීම ලෙස ගලපා ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රායෝගික නොවන්නේ නම් එම තත්ත්වය ඇති වීමට තුඩු දුන් හේතු සහ වරද නිවැරදි කර ඇත්තේ කවර කාලයක සිටද යන්න පිළිබඳ විස්තරයක් යනාදිය හෙළිදරව් කළ යුතු වුවත් පෙර වර්ෂ ගැලපීම් ලෙස ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශයෙහි සමුච්චිත ලාභය සඳහා රු.45,689,802 ක ගැලපීම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල කිසිදු හෙළිදරව් කිරීමක් සිදු කොට නොතිබුණි. | | |
| v. | දේපළ, පිරියත උපකරණ ගිණුම්ගත කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ට අනුකූලව කටයුතු කල යුතුව තිබුණද ඒ අනුව මූල්‍ය ප්‍රකාශ සටහන් දක්වන ලද බවට සාක්ෂි නොවිය. ඒ අනුව ස්ථාවර වත්කම්වල ආරම්භක ශේෂය, එකතු කිරීම්, ඉවත් කිරීම්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව ක්ෂය, දළ ධාරණ අගය, සමුච්චිත ක්ෂය, ශුද්ධ ධාරණ අගය ආදිය දේපළ පිරියත උපකරණ සටහනෙහි ඇතුලත් විය යුතු වුවද එහි 'මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව අවසන් ශේෂය' ලෙස ශුද්ධ අගය වෙනුවට පිරිවැය සටහන් කොට තිබුණි. | එම ප්‍රමිතියට අනුකූලව විස්තර ඉදිරිපත් කිරිම අවසන් ගිණුමේ පිටු අංක 15 මඟින් ඉදිරිපත් කර ඇත. නමුත් මෙම ආකෘතියේ වැඩිදියුණු විය යුතු කරුණු කිහිපයක් ඇත. ඒවා ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කල යුතු බව. |
| vi. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 86 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල එක් එක් දේපළ, පිරියත හා උපකරණ පන්තිය සම්බන්ධයෙන් වර්ෂය ආරම්භයේ හා අවසානයේ සමුච්චිත ක්ෂය අගයන් සටහන් මගින් හෙළිදරව් කොට නොතිබුණි. | 2024 ගිණුම ඉදිරිපත් කිරීමේ දී මෙම තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කල යුතු බව. |
| vii. | විගණන නියැදි පරික්ෂාවට අනුව රු.4,558,836 ක් වටිනා 2023 වර්ෂයේ කල වැඩ ගිණුමෙන් ඉවත් කරන ලද ලැප්ටොප්, ඩෙස්ක් ටොප් පරිගණක සහ පරිගණක උපාංග වැනි ස්ථාවර වත්කම් අයිතම 50 ක් 2022 වර්ෂයේ හෝ 2023 වර්ෂයේ ස්ථාවර වත්කම් සමීක්ෂණයන්හි පොදු 66 හෝ පොදු 47 ආකෘතියෙහි ඇතුලත්ව නොතිබීම හේතුවෙන් එම වත්කම් සිගාස් වැඩසටහන මගින් පවත්වාගෙන යනු ලබන වාර්තාවෙහි මෙන්ම මූල්‍ය | මෙම අයිතම අදාල අංශයට අදාල ඉන්වෙන්ට්‍රි ලේඛන තුල පහත සඳහන් පරිදි ඇතුලත් කර ඇත. එම වර්ෂයන්ට අදාල භාණ්ඩාගාර 66 හා පොදු 47 පරික්ෂා කිරීම සඳහා ප්‍රමාණාත්මක කාලයක් අවශ්‍ය වේ. | මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් බව තහවුරු කරගත් වත්කම් පමණක් ඉවත්කල යුතුබව. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රකාශනයන්හි ඇතුළත්ව තිබූ බව තහවුරු නොවීය. | | |
| viii. | 2023 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවන්හි වැඩහල 04 හි ආයුධ සමීක්ෂණ වාර්තාවන්හි තත්‍ය අගයන් ඇතුළත් කර නොතිබුණු අතර "සී" අංශයෙහි රු.5,947,315 ක් වටිනා තොග අයිතම 288 ක් සහ "ජී-ඔයිල්" අංශයෙහි රු.1,967,868 ක් වටිනා තොග අයිතම 16 ක් සත්‍යාපනය කර නොතිබුණි. | සමීක්ෂණ මණ්ඩල සභාපති හට අතපසුවීමකින් තත්‍ය ශේෂය ඇතුලත් කර නොමැති අතර, මේ වන විට එම තත්‍ය ශේෂය නැවත තහවුරු කර පොදු 66 වාර්තාව සම්පූර්ණ කිරීමට කටයුතු කර ඇත. | භාණ්ඩ සමීක්ෂණ වාර්තා සම්පූර්ණව නිවැරදිව ඉදිරිපත් කල යුතුය. |
| ix. | 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය අනුව 2008 හා 2009 වර්ෂවල පැවති ණයගැති ශේෂවල එකතුව රු.36,941,553 ක් වුවද ලියා හැරීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිත කමිටු වාර්තාව ප්‍රකාරව එම ණයගැතියන්ගේ එකතුව රු.4,045,992 ක් විය. එසේ තිබියදී මූල්‍ය ප්‍රකාශයන්හි 2008 හා 2009 වර්ෂයන්ට අදාළ ඉහත සඳහන් රු.36,941,553 ක් වූ මුළු ශේෂයම කපාහැර තිබුණි. | 2008 වර්ෂයේ ණයගැතියන් සම්බන්ධව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා ඇති අතර ඒ සම්බන්ධව කටයුතු කිරීමට නොහැකි බව දැනුම් දී ඇත. ඉන් අනතුරුව මේ ලිපියක් ජාතික අයවැය දෙපාර්තමේන්තුවට යොමු කර ඇති අතර ඉදිරියේදී ලැබෙන උපදෙස් අනුව කටයුතු කරන බව දන්වා සිටිමි. | නිසි අනුමැතියකින් තොරව ණයගැතියන් කපාහැරීම නොකල යුතු බව. |

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශනය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | වැඩ තහනම් කර ඇති නිලධාරියකුගෙන් අය විය යුතුව පවතින වර්ෂ 10 ත් 20ත් අතර පැරණි රු.142,650ක ණය ශේෂය මෙතෙක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | එම ණය ශේෂය කපා හැරීමට අදාලව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය වෙත යොමුකල අතර ඒ සම්බන්ධයෙන්, ඔහුට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගෙන තිබේද යන්න හා ණය සුරැකුම් රක්ෂණාවරණයක් යටතේ අදාල ණය ශේෂය අයකර ගැනීමට ඇති හැකියාව පිළිබඳව අමාත්‍යාංශය වෙත වාර්තා කිරීමට අදාලව පියවර ගනිමින් පවතී. | ඇප කරුවන්ගෙන් හෝ ණය සුරුකුම් රක්ෂණ මඟින් ණය ශේෂ අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව. |
| ii. | සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 13 දෙනෙකුගේ වර්ෂ 20 ට වැඩි රු.59,800 ක ශේෂය, වර්ෂ10 ත් 20ත් අතර වූ රු.282,880 ක ශේෂය, වර්ෂ 05 ත් 10ත් අතර අයවිය යුතුව පවතින රු.227,550 ක | නීතිපති දෙපාර්තමේන්තුව, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හා අදාල පොලිස් ස්ථාන වෙතින් තොරතුරු විමසමින් ක්‍රියාමාර්ග ගැනීම නිසා මෙම ණය | සේවය අතහැර ගිය නිලධාරීන් පිළිබඳ තොරතුරු විමසමින් ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට |

| | | |
|---|---|---|
| ශේෂය හා රු.82,360 ක වර්ෂ 01ත් 03ත් අතර වන වෙනත් ණය ශේෂයන් මෙතෙක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | ශේෂයන්ගෙන් වාරික වශයෙන් අය කර ඇති වටිනාකම රු.394,950/- ක් වන අතර එයින් රු.257,640/- ක වටිනාකමක් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව. |

**(ඉ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | **ස්ථාවර වත්කම් ලේඛනය**<br>2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.1 ඡේදය ප්‍රකාරව සිගාස් වැඩසටහන තුළ ස්ථාවර වත්කම් මොඩියුලය මගින් වත්කම් ලේඛනය පිළියෙල කර යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් පවතී. | සිගාස් වැඩසටහන තුළ ස්ථාවර වත්කම් මොඩියුලය මගින් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගත යුතු බව. |
| ii. | **තොග පොත**<br>මුදල් රෙගුලාසි 751 හා 763 ප්‍රකාරව තොග පොත් පවත්වා නොතිබුණි. | තොග ලේඛනයන්හි පවතින අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව තොග පොත් පවත්වා ගත යුතුය. |
| iii. | **හානි පිළිබඳ ලේඛනය**<br>මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | 2023 වර්ෂයේ සිට යථාවත් කරගෙන යනු ලබයි. | හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතු බව. |
| iv. | **බැරකම් පිළිබඳ ලේඛනය**<br>මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | 2024 වර්ෂයේ සිට යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ. | බැරකම් නිතිපතා පරික්ෂා කළ හැකි වන පරදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතු බව. |

**(ඊ) විගණන සාක්ෂි නොවීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | සමාලෝචිත වර්ෂයේදී කල වැඩ අත්තිකාරම් ගිණුමෙහි රු. 3,495,038 ක සෘජු ගැණුම් වලට අදාල විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කල නොහැකි විය. | ගෙවීම් විශ්ලේෂණය ඔබ වෙත ඊ මේල් පණිවිඩයක් මඟින් ඉදිරිපත් කරන ලදී. වැඩිදුරටත් වවුචර්පත් වල විස්තර මේ සමඟ ඉදිරිපත් කරමි. | මූල්‍ය ප්‍රකාශන වල ශේෂයන් සඳහා අදාල විස්තරාත්මක උපලේඛන පවත්වා ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| ii. | සමාලෝචිත වර්ෂයේදී කල වැඩ අත්තිකාරම් ගිණුමෙහි රු. 1,798,386 ක විවිධ වියදම් වලට අදාල විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කල නොහැකි විය. | ගෙවීම් විශ්ලේෂණය ඔබ වෙත ඊ මේල් පණිවිඩයක් මඟින් ඉදිරිපත් කරන ලදී. වැඩිදුරටත් වවුචර්පත් වල විස්තර මේ සමඟ ඉදිරිපත් කරමි. | මූල්‍ය ප්‍රකාශන වල ශේෂයන් සඳහා අදාල විස්තරාත්මක උපලේඛන පවත්වා ගත යුතු බව. |
| iii. | සමාලෝචිත වර්ෂයේදී කල වැඩ අත්තිකාරම් ගිණුමෙහි රු. 1,682,924ක ක්ෂය සංචිත අරමුදලට අදාල විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කල නොහැකි විය. | මේ සම්බන්ධ තොරතුරු පවතින ලිපිගොනු වලින් සොයාගත නොහැක. | මූල්‍ය ප්‍රකාශන වල ශේෂයන් සඳහා අදාල විස්තරාත්මක උපලේඛන පවත්වා ගත යුතු බව. |
| iv. | රු. 53,161,909 ක් වටිනාකමැති කල වැඩ අත්තිකාරම් ගිණුමට අදාලව 2021 වර්ෂයේදී ලියා හරින ලද ණය ගැතියන් සඳහා අදාල අනුමැතීන් නොමැති වීම හේතුවෙන් ණය ගැතියන් ලියා හැරීම විගණනයට පිළිගත නොහැකි විය. | මේ සම්බන්ධව ජාතික අයවැය දෙපාර්තමේන්තුවට යොමු කර ඇති අතර ඉදිරියේදී ලැබෙන උපදෙස් අනුව (MUDH/HC/F/02/02/08) කටයුතු කරන බව දන්වා සිටිමි. | 2021 වර්ෂයේ ලියා හරින ලද ණය ගැතියන් සඳහා විධිමත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් කල යුතු බව. |
| v. | සමාලෝචිත වර්ෂයේදී කල වැඩ අත්තිකාරම් ගිණුමෙහි රු. 8,096,087 ක බාහිර පාර්ශවයන්ගෙන් ලබාගත් ව්‍යාපෘති සේවා වියදම් වලට අදාල විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කල නොහැකි විය. | ගෙවීම් විශ්ලේෂණය ඔබ වෙත ඊ මේල් පණිවිඩයක් මඟින් ඉදිරිපත් කරන ලදී. වැඩිදුරටත් වවුචර්පත් වල විස්තර මේ සමඟ ඉදිරිපත් කරමි. | මූල්‍ය ප්‍රකාශන ශේෂයන්ට අදාල විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කල යුතු බව. |
| vi. | සමාලෝචිත වර්ෂයේදී කල වැඩ අත්තිකාරම් ගිණුමෙහි රු. 278,829 ක බාහිර පාර්ශවයන්ගෙන් ලබාගත් ව්‍යාපෘති නොවන වියදම් වලට අදාල විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කල නොහැකි විය. | ගෙවීම් විශ්ලේෂණය ඔබ වෙත ඊ මේල් පණිවිඩයක් මඟින් ඉදිරිපත් කරන ලදී. වැඩිදුරටත් වවුචර්පත් වල විස්තර මේ සමඟ ඉදිරිපත් කරමි. | මූල්‍ය ප්‍රකාශන ශේෂයන්ට අදාල විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කල යුතු බව. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | - | | | |
| i. | මුදල් රෙගුලාසි අංක 504 (2) | - | එක් එක් කාර්තුව අවසානයේදී අවස්ථානුරූප ලාභාලාභ ගිණුමක් පිළියෙල කර කාරක පාඩු පියවීම සම්බන්ධයෙන් වූ ප්‍රතිපාදන සලසා ගැනීමේ ක්‍රියාමාර්ගයක් වශයෙන් යොදාගත යුතු වූවද එලෙස ගිණුමක් පිළියෙල කර ප්‍රධාන ගණන් දීමේ නිලධාරි වෙත විගණකාධිපතිවරයාටද පිටපතක් සහිතව ඉදිරිපත් කර නොතිබුණි. | 2024 වර්ෂය තුල විගණන නිර්දේශ පරිදි කටයුතු කරමි. | අවස්ථානුරූප ලාභාලාභ ගිණුමක් පිළියෙල කල යුතු බව. |
| ii. | මුදල් රෙගුලාසි අංක 571 (3) | 1,037,461 | වසර දෙකකට වඩා වැඩි කාලයක් තුල නිරවුල් නොවූ ටෙන්ඩර් තැන්පතු ශේෂය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදාළ ලිපිගොනු පරීක්ෂා කරමින් කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| iii. | මුදල් රෙගුලාසි අංක 1645 | - | පවත්වා ගතයුතු වාහන ලොග් සටහන් පොත් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | මෙවැනි ලේඛණයක් පිළිබදව සොයාගැනීම ට නොහැකි විය. | ලොග් සටහන් පොත් යාවත්කාලීනව පවත්වාගත යුතුය. |
| (ආ) | භාණ්ඩාගාර ලේකම්ගේ අංක MF/CG/02/(iv) හා 2017.06.28 | - | වත්කම් හා පිරිවැය කළමනාකරණය සඳහා රජයේ සියලු මූල්‍ය නොවන වත්කම් | මේ සම්බන්ධව කොම්ප්ට්‍රොලර් ජනරාල් | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | දිනැතිව නිකුත් කර ඇති 01/2017 වත්කම් කළමනාකරණ චක්‍රලේඛය. | | ලේඛනගත කිරීම යටතේ කොම්ප්ට්‍රෝලර් ජනරාල්ට යැවිය යුතු තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | මගින් විමසීම් කිරීමේදී වාහන තොරතුරු පද්ධතියට ඇතුලත් කරන ලෙස දන්වා ඇත. | |
| (ඈ) | 2023 නොවැම්බර් 30 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 05/2023 චක්‍රලේඛය 3.3 ඡේදය | - | එළඹෙන ලද බැඳීම් සහ වගකීම් වෙන වෙනම හෙළිදරව් කර නොතිබුණි. | අදාල නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරමින් පවතී. | රාජ්‍ය ගිණුම් මාර්ගෝප දේශ ප්‍රකාරව කටයුතු කල යුතු බව. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 දැක්ම හා මෙහෙවර**

යාන්ත්‍රික ඉංජිනේරුමය කාර්යයන් ඉටු කිරීම සඳහා “ඒ” පංතියේ දෙපාර්තමේන්තුවක් වශයෙන් රජයේ 1971 ජනවාරි 10 දින ස්ථාපනය කර ඇති රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ දැක්ම තිරසාර සංවර්ධනය තුලින්, ඉදිරි ශ්‍රී ලාංකීය යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ, නිෂ්පාදන, සේවා සහ පුහුණුව සපයන විශිෂ්ඨතම රාජ්‍ය ආයතනය බවට පත්වීම විය. දෙපාර්තමේන්තුවේ කාර්යයන් නිෂ්පාදන ක්ෂේත්‍රය, ඉදිකිරීම් ක්ෂේත්‍රය (බර වැද්දුම්), අළුත්වැඩියා සහ නඩත්තු ක්ෂේත්‍රය සහ යාන්ත්‍රික ඉංජිනේරු උපදේශාත්මක සේවා යන ක්ෂේත්‍රයන් 04 ක් යටතේ විහිදී ඇත.

**3.2 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොඩනැගිලි ඉදිකිරීම් ව්‍යාපෘති ඉටුකරලීම දෙපාර්තමේන්තුවේ කාර්යයක් නොවුවද ජන මාධ්‍ය අමාත්‍යාංශයේ පැරණි මැදිරි සංකීර්ණය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය ඉටුකිරීමේ කොන්ත්‍රාත්තුව භාරගෙන 2019 අගෝස්තු 26 දින පුවත්පත් දැන්වීම් පලකර විවෘත ලංසු කැඳවා රු.16,510,934 ක (වැට් රහිත) කොන්ත්‍රාත් අගයකට බාහිර කොන්ත්‍රාත්කරුවකු වෙත පවරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |

| | | | |
|---|---|---|---|
| i. | මෙහිදී ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව යටතේ ඇති සමාගමක් (REDECO) රු.14,376,520 ක අගයකටත් වෙනත් පෞද්ගලික සමාගමක් රු.16,510,934 ක අගයකටත් ලංසු ඉදිරිපත් කර තිබුණි. එසේ වුවද ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචිය නියමිත දිනට අළුත් නොකිරීම හේතුවෙන්, ඒ පිළිබඳ විමසීමකින් තොරව 2019 සැප්තැම්බර් 06 දින රැස් වූ තාක්ෂණික ඇගයුම් කමිටුව අඩුම මිළගණන් ඉදිරිපත්කල REDECO සමාගම ප්‍රතික්ෂේප කර වෙනත් පෞද්ගලික සමාගමක් තෝරාගෙන තිබුණි. එසේ වුවද 2013 අගෝස්තු මස 30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක 13/1114/503/085 අනුව සාමාන්‍ය ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරව රු. මිලියන 30 දක්වා වූ කොන්ත්‍රාත්තු රෙඩෙකෝ (REDECO) සමාගම වෙත ලබා දීමට රාජ්‍ය ආයතනවලට බලය පවරා තිබුණි. | ගොඩනැගිලි නඩත්තුවට අදාළව වැඩහල 16 ලෙස ඒකකයක් පවත්වාගෙන යනු ලබන අතර මෙම ව්‍යාපෘතිය භාරගන්නා අවස්ථාවේ රජයේ කර්මාන්තශාලාවේ සිවිල් ඉංජිනේරුවරයෙකු ද සේවයේ යෙදී සිටින ලදී. දෙපාර්තමේන්තුගත සේවකයින්ගේ වැටුප් හා දීමනා ඇතුළු වැඩපත් වලට අදාළ අනෙකුත් පිරිවැය එම ඒකකය මගින්ම උපයාගත යුතුව ඇත. ඒ අනුව මෙවැනි කාර්යයන් රජයේ කර්මාන්තශාලාව විසින් භාරගනු ලබන අතර ඒ අතරින් කාර්මාන්තශාලාව තුල පවතින මානව සම්පත් ඇතුළු අනෙකුත් සම්පත් යොදාගෙන එම කාර්යයන් සිදුකිරීම අපහසු අවස්ථාවලදී පමණක් ඒවා බාහිර ආයතන මගින් ද ඉටුකර ගනු ලබයි. | දෙපාර්තමේන්තුව ස්ථාපනය කිරීමේ අරමුණට හා කාර්යයන්ට අනුකූලව ක්‍රියාකිරීමට කළමනාකරණය කටයුතු කළ යුතු බව. |
| ii. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත් සඳහා විධිමත් ආකෘතිපත්‍ර යටතේ එයට අනුකූල වූ විධිමත් කොන්දේසි සහිත ගිවිසුමකට ඇතුලත් විය යුතු වුවත් 2019 ඔක්තෝබර් 25 දින කොන්ත්‍රාත්කරු සමඟ එළඹ තිබූ ගිවිසුමෙහි එවැනි නීත්‍යානුකූලභාවයක් නොතිබුණි. | ඒ සඳහා භාවිතා කොට ඇත්තේ වැඩ හා සේවා සඳහා ICTAD ආයතනයෙන් නිකුත් කරන ලද සම්මත ලංසු කැඳවීමේ ආකෘති පත්‍රවල සඳහන් විධිමත් ගිවිසුම් ආකෘති පත්‍රයයි. එම ගිවිසුම ආකෘති පත්‍රය හා ගිවිසුම්ගත වීමේදී එයට අදාළ සියලුම ලංසු කැඳවීම් තොරතුරු මෙම ගිවිසුම තුළින් නිර්වචනය වන බැවින් එම ගිවිසුම්ගත වීම නීතියානුකූල බව අපගේ අදහසයි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව විධිමත් විස්තරාත්මක ගිවිසුමකට එළඹිය යුතුවේ. |
| iii. | කොන්ත්‍රාත්කාර සමාගම විසින් එක් එක් අයිතමයන්ට එවා තිබූ රේටයන් හා ඉංජිනේරු ඇස්තමේන්තුව අතර සියයට 8 සිට සියයට 409 දක්වා විචලතාවයක් දක්නට විය. මේ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.11 වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්කරුගෙන් හේතු පැහැදිලි කරවා ගැනීමට රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් ලබා දී ඇති වාර්තා අනුව තාක්ෂණ ඇගයීම් කටයුතු එක් එක් අයිතමයන් වෙන වෙනම නොසලකා පොදුවේ සිදුකොට ඇති අතර මුළු ඇස්තමේන්තු අගය ඉංජිනේරු ඇස්තමේන්තුව තුළ පවතින බැවින් මෙම කොන්ත්‍රාත්තුව අවම ලංසුකරු වෙත ප්‍රදානය කිරීමට තීරණය කරන ලදී. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| iv. | මෙසේ නවීකරණය කරන ලද ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ගොඩනැගිල්ල වැහි දිනවල ජලයෙන් පිරී යන බැවින් වර්තමානයේ භාවිතයට ගත නොහැකි තත්ත්වයක පැවතුණි. එවැනි තත්ත්වයකදී කාර්යසාධන බැඳුම්කරය නිදහස් කිරීම සඳහා 2022 පෙබරවාරි 23 දින කොන්ත්‍රාත්කරු විසින් කරන ලද ඉල්ලීම දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර තිබුණි. | අදාල ගොඩනැගිල්ල ඔවුන් වෙත භාරදී ඇති බව දන්වමින් කාර්යයසාධන බැඳුම්කරය නිදහස් කිරීම සඳහා නිර්දේශ ලබා දී තිබූ පසුබිමක කාර්යයසාධන බැඳුම්කරය ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් නිදහස් කිරීමට කටයුතු කරන ලදී. | කාර්යසාධන සුරක්ෂණය නිදහස් කිරීමට පෙර ඉදිකිරීම් කාර්යයේ සියලු වැඩ අවසන් කරවා ගැනීමේ වගකීම භාරගත යුතු බව. |
| v. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.6 (අ) අනුව කොන්ත්‍රාත්කරුවකුට ගෙවිය යුතු සෑම ගෙවීමකින්ම නිශ්චිත මුදලක් රඳවා තබා ගැනීමේ මුදලක් ලෙස ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් රඳවා තබාගත යුතු වූවද එසේ තබාගෙන නොතිබුණි. | මේ වන විටත් අවසන් ගෙවීම සිදුකොට නොමැති බැවින් අදාල නිවැරදි කිරීම් සහිතව ඉදිරි ගෙවීම් සිදු කිරීමට බලාපොරොත්තු වේ. | කොන්ත්‍රාත්කරු වෙත සිදු කරන සෑම ගෙවීමකින්ම නිශ්චිත මුදලක් රඳවා ගත යුතු බව. |

## 3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ කර්මාන්තශාලාවේ එතෙක් පැවති පැරණි පරිගණක මෘදුකාංග පද්ධතියෙහි දුර්වලතා හේතුවෙන් පද්ධතිය වැඩි දියුණු කිරීම වෙනුවෙන් 2021 වර්ෂයේදී මිල ගණන් කැඳවා පෞද්ගලික සැපයුම්කරුවකු තෝරාගෙන අදාල සැපයුම්කරු වෙත රු.2,954,700 ක් 2021 දෙසැම්බර් 31 දින ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| i | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (අ) අනුව කිසිම සාමාජිකයකු ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව යන කමිටු දෙකෙහිම නොසිටිය යුතු බවට දක්වා තිබුණද, මෙහි එක් නිලධාරියකු කමිටු දෙකෙහිම සේවය කර තිබුණි. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (ආ) අනුව විෂයය පිළිබඳ විශේෂඥයින්ගෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව සමන්විත විය යුතු වුවද එවැනි සාමාජිකයින් පත් කරගෙන නොතිබුණි. | එකම නිලධාරියෙකු කමිටු දෙකෙහිම සේවය කිරීම පිළිගන්නා අතර එය තොරතුරු තාක්ෂණ සේවයේ මනා දැනුම හා පළපුරුද්ද සහිත නිලධාරියෙකු නොසිටීම මත සිදු වූවක් බවත් ඉදිරියේදී මෙවැනි කටයුතු කිරීමේදී මෙවන් තොරතුරු තාක්ෂණ සේවයේ නිලධාරියෙකු යොදවා ගැනීමට බලාපොරොත්තු වෙමු. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන සහ තාක්ෂණික ඇගයීම් කමිටු පත්කල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| ii. | යලි ඇනවුම් මට්ටමේදී ගබඩා ඇනවුම ස්වයංක්‍රියව නිර්මාණය වී අනුමැතිය සඳහා ඉදිරිපත්වන බවට පිරිවිතරයන්හි දක්වා තිබුනද අතින් ලියන ලද ගබඩා ඇනවුම් මිලට ගැනුම් අංශයට ඉදිරිපත් වන බව විගණිත දින වූ 2024.03.01 දින විගණනයට නිරීක්ෂණය විය. තවද ඇස්තමේන්තු වටිනාකම් පද්ධතියෙන් නිර්මාණය කිරීමට පහසුකම් සලසා දෙන බවට පිරිවිතරයෙහි දක්වා තිබුණද 2023 වර්ෂය සඳහා ලබා දෙන ලද සමුච්චිත වැඩ සාරාංශ වාර්තාවෙහි ඇස්තමේන්තු ගත ද්‍රව්‍ය සහ ශ්‍රම පිරිවැය දක්වා නොතිබුණි. මේ හේතුවෙන් සත්‍ය වියදම හා ඇස්තුමේන්තුගත වියදම අතර විචලතාවයක් පවතින්නේ කාර්යය පත්‍රයක අමුද්‍රව්‍යද, ශ්‍රමයද නැතහොත් අනෙකුත් පොදු කාර්යය වියදම් වලින්ද යන්න තහවුරු කරගත නොහැකිවිය. | පද්ධතියේ නිවැරදිකිරීම් මේ වන විටත් ඉටු කරමින් ඇති පසුබිමක පද්ධතියේ නඩත්තු පිළිබඳව ගිවිසුම් කිසිවකට මේ වන විටත් එළඹී නැති බවට දැන්වීමට කැමැත්තෙමු. පද්ධති යථා පරිදි සංවර්ධනය කර වැඩ නිම වූ පසු සුදුසු පරිදි තාක්ෂණික වාර්ථාවක් කැඳවා මේ පිළිබඳ තීරණයක් ගැනීමට බලාපොරොත්තු වෙමු. | පද්ධතිය ස්ථාපිත කිරීමේ හා වැඩිදියුණු කිරීමේ අරමුණ සාක්ෂාත් කරගැනීමට ප්‍රමාදයකින් තොරව කටයුතු කල යුතු බව. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට FMS පද්ධතිය මඟින් ජනනය වෙන තොග ශේෂයන් සම්බන්ධ තොරතුරු විගණනය විසින් ඉල්ලා සිටියද යාවත්කාලීන කරන ලද එවැනි වාර්තාවක් පද්ධතිය හරහා ජනනය කර ලබා නොදුන් අතර ගිණුම් අංශය විසින් පිලියෙළ කරන ලද තොග වාර්තා විගණනයට ඉදිරිපත් කෙරුණි. එම වාර්තාවේ අයිතමවල කිසිඳු දිනයක් හෝ කාල පරාසයක් නොතිබුනු අතර තොග වාර්තාවෙහි රු.1,723,305 ක් වටිනා අයිතම් 04 ක සෘණ අගයන් සටහන් වී තිබුණ ද එම ශේෂයන් තොග පොත් අනුව සොයාගත නොහැකි විය. | FMS පද්ධතිය තුළ 2023.12.31 ට තොග ශේෂ ගණනයට පහසුකම් සලසා ඇති අතර එම ශේෂ ස්ථාවර වත්කම් සමීක්ෂණ වලදී තහවුරු කිරීමට පහසුකම් සලසා ඇත. මෙම කාර්යය විවිධ හේතුන් මත 2023 වර්ෂයට සිදුකළ නොහැකි වී ඇති අතර ඒ හේතුවෙන් 2023 වර්ෂයට මෙම වාර්ථාව ලබාගත නොහැක. 2024.12.31 දිනට තොග ශේෂ ගණනය කර මෙය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | පද්ධතිය ස්ථාපිත කිරීමේ හා වැඩිදියුණු කිරීමේ අරමුණ සාක්ෂාත් කරගැනීමට ප්‍රමාදයකින් තොරව කටයුතු කලයුතු බව. |

## 3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශය සඳහා තාවකාලික ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද රු.104,412,899 ක් වූ ඇස්තමේන්තුවට තැපැල් දෙපාර්තමේන්තුව එකඟවී 2018 දෙසැම්බර් 31 දින රු.3,795,000 ක් ගෙවා තිබුණි. එසේ වුවද අදාළ ඉදිකිරීමට යෝජිත | මෙම ඉදිකිරීමට අදාලව තැපැල් දෙපාර්තමේන්තුව විසින් ඒ ඒ ආයතන වලින් ලබාගතයුතු වූ අනුමැතීන් ලබාගැනීම දිගින් දිගටම ප්‍රමාද වීම නිසා කාර්යය ආරම්භ කිරීම මේ දක්වා ප්‍රමාද වී ඇත. විකල්ප ක්‍රියා මාර්ග වෙත යොමුවීම සම්බන්ධයෙන් වන | ඉදිකිරීම් ව්‍යාපෘති සිදු කිරීම දෙපාර්තමේන්තුවේ විෂය පථයට නොගැනෙන බැවින් නඩත්තු/ අළුත්වැඩියා කටයුතු හැර වෙනත් අවදානම් |

| | | |
|---|---|---|
| ඉඩමෙහි පස සුදුසු නොවන බව 2019 ජනවාරි 13 දින පැවති සාකච්ඡාවේදී තහවුරු වී තිබුණු බැවින් අළුතින් සකස් කරන සැලසුමකට අනුව වෙනත් ස්ථානයක ඉදිකිරීමකට යැයි දක්වා තවත් රු.10,710,572 ක් 2019 මාර්තු 14 දින හා රු.7,694,000ක් 2020 මාර්තු 06 දිනද ලෙස එකතුව රු.22,199,572ක් මෙම දෙපාර්තමේන්තුවට තැපැල් දෙපාර්තමේන්තුවෙන් අයකරගෙන තිබුණි. එසේ වුවද 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියෙහි ප්‍රගතිය සියයට 10 ක් පමණක් විය. වසර 05 ක් ගත වූවද ව්‍යාපෘතිය නිමකර දීමට හෝ ලද මුදල් ආපසු ගෙවීමට හෝ කටයුතු කර නොතිබුණි. | යෝජනා සහිත වාර්තාවක් තැපැල් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කරමින් පවති. | සහිත ව්‍යාපෘති භාර නොගත යුතුය. |

## 3.5 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවට අයත් කොළොන්නාව පිහිටි නිල නිවාස 24 ක් එම නිවාසයන්හි නානකාමර වල ජලය කාන්දුවීම අළුත්වැඩියා නොකිරීම හේතුවෙන් පාවිච්චි නොකර ඌන උපයෝජිතව පැවතුණි | ජල කාන්දුවීම් පවතින නිවාස 24න් 11 ක් පමණ නැවත අළුත්වැඩියා කර ඇති අතර ඉතිරි නිවාස අළුත්වැඩියාව සඳහා ලබා දීමට කටයුතු සුදානම් කර ඇත. | දෙපාර්තමේන්තුව සතු වත්කම් භාවිතා කල හැකි පරිදි අළුත්වැඩියා කොට නිසිපරිදි නඩත්තු කිරීමට වග බලා ගත යුතු බව. |
| (ආ) | දෙපාර්තමේන්තු පරිශ්‍රයේ එළිමහනේ කිසිඳු ප්‍රයෝජනයක් නොගෙන අව්වට වැස්සට නිරාවරණව දිරාපත් වෙමින් වසර ගණනාවක සිට පැවතෙන වටිනා වාහන, යන්ත්‍ර සූත්‍ර යනාදිය විශාල ප්‍රමාණයක් නිරීක්ෂණය වූ අතර ඒ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. මෙම වත්කම් මු.රෙ.445 ප්‍රකාරව ඉන්වෙන්ට්‍රිගත වී ස්ථාවර වත්කම් ලේඛණයන්හි ඇතුලත් වී ඇත්ද, ඒවායෙහි වටිනාකම් කවරේද, හඳුනාගැනීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූ අතර භාණ්ඩ සමීක්ෂණයන්හි මේ පිළිබඳ වාර්තා වි නොතිබුණු අතර මේ හේතුවෙන් මු.රෙ.756 ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණයන් සිදුකරන බව විගණනයට පිළිගත නොහැකි විය. | දෙපාර්තමේන්තු විගණන හා කළමනකරණ කමිටුවේදී ලද උපදෙස් අනුව පරිශ්‍රය තුල පවතින අදාල අංශවල ඉන්වෙන්ට්‍රි ලේඛණවලට ඇතුලත් නොවූ වත්කම් හඳුනාගෙන පොත්වලට ඇතුලත් කිරීම සඳහා කමිටුවක් හරහා කටයුතු කෙරෙමින් පවතී. | වත්කම් නිසිපරිදි කළමනාකරණය කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විකිණීම සඳහා දෙපාර්තමේන්තුව විසින් නිෂ්පාදනය කරනු ලැබූ යන්ත්‍ර හා නොයෙකුත් උපාංග විකුණා ගැනීමකින් තොරව මළකඩ කමින් ගබඩාවන්හි රඳවාගෙන තිබෙනු භෞතික පරීක්ෂාවන්හීදී විගණනයට නිරීක්ෂණය විය.<br>දෙපාර්තමේන්තුවේ අලෙවි අංශය විසින් මෙම භාණ්ඩ සඳහා කිසිඳු ප්‍රචාරණයක් ලබා නොදෙන බවත් ප්‍රදර්ශනාගාරයක් ලෙස ඉදිකර ඇති ගොඩනැගිල්ල විගණනය විසින් පරීක්ෂා කරනු ලබන අවස්ථාවේදීත් වසාදමා තිබෙනු නිරීක්ෂණය විය. එමෙන්ම මෙම ප්‍රදර්ශනාගාරය මහාමාර්ගයෙහි ගමන් කරනු ලබන කිසිඳු පුද්ගලයෙකුට එකවර හඳුනාගත හැකි, ආකර්ශණීය ස්ථානයක් නොවන බවත් දෙපාර්තමේන්තුව සතුව ඇති වටිනා ඉඩම් වත්කමින්ද මෙවැනි ආකාරයේ කිසිඳු ප්‍රයෝජනයක් ගැනීමට ක්‍රියාකර නොමැති බව නිරීක්ෂණය විය. | විකිණීම සඳහා දෙපාර්තමේන්තුව විසින් නිෂ්පාදනය කරණු ලැබූ යන්ත්‍ර හා නොයෙකුත් උපාංග, ඒ ඒ අවස්ථාවලදී වෙළඳපොල ඉල්ලුම උච්චාවචනය වීම, එක් එක් අවස්ථාවලදී රජයන් විසින් ගනු ලැබූ තීරණ වැනි අනපේක්ෂිත හේතූන් නිසා අලෙවිකර ගැනීමට නොහැකි වී ඇත. දෙපාර්තමේන්තුවේ ප්‍රදර්ශනාගාරය විධිමත් පරිදි පවත්වාගෙන යාම, උග්‍ර සේවක හිඟය හේතුවෙන් ගැටළු සහගත වී ඇත. | වැඩහල් සඳහා ලැබෙන කොන්ත්‍රාත් අඩුවීම මත නිෂ්කාර්යව සිටින සේවකයන් යොදවා ඌන උපයෝජිත ප්‍රදර්ශනාගාරයෙන් සහ නිෂ්පාදනය කරනු ලැබූ යන්ත්‍ර හා නොයෙකුත් උපාංග වලින්ද ආදායමක් උපයාගැනීමට කටයුතු කල යුතු බව. |

## 3.6 කළමනාකරණ දූර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **රජයේ නිවාස පවත්වාගෙන යාම** | | |
| i. | රජයේ කර්මාන්තශාලීය සංහිඳ සෙවණ මහල් නිවාසයන්හි පවත්නා අක්‍රමිකතා සම්බන්ධයෙන් අතෘප්තියට පත් සංහිඳ සෙවණ මහල් නිවාසයන්හි පදිංචි දෙපාර්තමේන්තු සේවකයන් විසින් පොලිස්පතිතුමාටද පිටපතක් සහිතව මාධ්‍යයක් වෙත යොමු කර තිබූ ලිපියකට අනුව, විශ්‍රාම ගිය නිලධාරීන් රාජ්‍ය නිවාස භාවිත කිරීම, විදේශගත වීමෙන් පසුවද පදිංචිව සිටීම, රජයේ නිවාස වෙනත් බාහිර පාර්ශවයන්ට කුලියට දීම, අයිස් මත්ද්‍රව්‍ය භාවිතය, සේවකයන් වැඩ තහනම්ව තිබියදී රජයේ නිවාස පරිහරනය කිරීම, සුනඛයන් ඇති කිරීම, නිවාස බලධාරින් විසින් පරීක්ෂා නොකිරීම යන කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කර තිබුණි. එසේ වුවද 2023 නොවැම්බර් 10 දින අවසන්වරට රැස්ව තිබුණු නිවාස කමිටුව විසින් නිවාස 26 ක් පමණක් පරීක්ෂාකර තිබූ අතර ඉතිරි නිවාසද පරීක්ෂාකර බලා අවශ්‍ය ක්‍රියාමාර්ගය ගැනීමට කටයුතු කිරීමට 2024 | විශ්‍රාමික නිලධාරීන්ට නිල නිවාස ලබා දී නොමැත. විදේශගත වී ඇති නිලධාරින්ගේ නිවාස නැවත ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. වෙනත් බාහිර පාර්ශවයන්ට නිල නිවාස කුලියට දී ඇති බව අනාවරණය වූ නිලධාරින්ගෙන් දණ්ඩන කුලී අයකර එම නිවාස නැවත පවරා ගැනීමට කටයුතු කර ඇත. තවද අයිස් මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ තොරතුරු දැනගැනීමට ලැබූ වහාම පොලිසියට දැනුම් දී අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | රජයේ නිවාස භාවිතයේදී පිළිපැදිය යුතු උපදෙස් පිළිනොපදින නිලධාරීන්ට විරුද්ධව නොපමාව ක්‍රියාමාර්ග ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | අප්‍රේල් 01 විගණිත දිනය වන තෙක්ම අපොහොසත් වී තිබුණි. | | |
| ii. | දෙපාර්තමේන්තුවේ සිට පිටතට මාරු වී ගිය නිලධාරියෙකු පදිංචිව සිටි 21/18 දරණ නිවසේ ගිවිසුම්ගත කාලය 2023 පෙබරවාරි 11 දිනෙන් අවසන් වී ඇති අතර නිලධාරියා මේ වන තෙක්ම අදාළ නිවස භාරදීමට කටයුතු කර නොතිබුණි. ආයතන අංග්‍රහයේ XIX වන පරිච්ඡේදයේ 7.2 වගන්තිය අනුව ඔහුගෙන් අයවිය යුතු දන්ඩණ කුලිය හා විවෘත වෙළඳපොල කුලිය යන දෙකේ එකතුව ලෙස රු.679,851 ක් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවතුණි. | 21/8 නිවස 2024.02.26 වන දින නැවත මෙම දෙපාර්තමේන්තුව වෙත භාරදී ඇත. එදින දක්වා දණ්ඩන කුලිය ගෙවිය යුතු මුළු මුදල වන රු. 810,134.86 ක මුදල අයකර එවන ලෙස අංක 01/3/4/11(21/8) හා 2024.04.03 දිනැති නාගරික සංවර්ධන හා නිවාසස අමාත්‍යාංශයේ නාගරික සංවර්ධන අංශයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යවා ඇත. | නව සේවා ස්ථානය හරහා හිඟකුළී හා දඩ මුදල් අයකරගැනීමට නොපමාව කටයුතු කල යුතු බව. |
| (ආ) | රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු, පලාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන ජාතික උත්සවයන් වෙනුවෙන් වේදිකා ඉදිකිරීමේ කාර්යය රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව විසින් කරනු ලබන අතර 2023 වර්ෂයේදී ද මේ සඳහා රු.54,164,000 ක් වටිනා බිල්පත් ඉදිරිපත් කර අදාල වැය ශීර්ෂයට හර කර තිබුණි. මේ සඳහා යොදාගනු ලබන GI පයිප, H අයන්, අමානෝ තහඩු කාප්ප, කොච් කණු ආදී නොයෙකුත් අමුද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් මීට පෙර මිළදී ගෙන තිබුණද මෙම තොග සම්බන්ධ කිසිදු තොග ලෙජරයක් ගබඩාවන්හි පවත්වාගෙන නොයන අතරම මෙම තොගය කොපමණ ප්‍රමාණයක්ද යන්න තහවුරු නොවීය. මෙම වේදිකා ඉදිකිරීම් සඳහා අමුද්‍රව්‍ය, තොගයෙහි නිරතුරුව පවත්වා ගත යුතු වුවත් හදිසි අවශ්‍යතා මත අයිතම් මිලදී ගැනීම සඳහා අත්තිකාරම් ලෙස රු.10,000, රු.20,000 හා රු.25,000 වශයෙන් නිරතුරුවම මුදල් ලබාගෙන දෙපාර්තමේන්තුව අවට ඇති හාඩ්වෙයාර් වෙළඳ කුටි මඟින්ම වරින් වර මිලදී ගැනීම කර තිබුණි. | ජාතික නිදහස් දින උළෙලේ ඉදිකිරීම් සඳහා Box bar, Z perline සෙවිලි තහඩු, H iron වැනි අමුද්‍රව්‍ය ගබඩා කර තබා තීන්ත ආලේප කර සෑම වසරකම ඉදිකිරීම් සඳහා භාවිතා කරනු ලැබේ. නමුත් තීන්ත, ඇණ, වෙල්ඩින් අමුද්‍රව්‍ය වැනි අමුද්‍රව්‍ය සෑම වසරකම මිලදී ගනු ලැබේ. තවද Carpet හා plywood sheet ද අවශ්‍යතාවයමත මිලදී ගනු ලැබේ. මෙම අමුද්‍රව්‍ය ලේඛනයට ඇතුළත් කිරීමට මේ වනවිට කටයුතු කරමින් පවතී. හදිසියේ මිලදී ගැනීමට අවශ්‍ය සරනේරු, ෂීට් ඇණ, වෙල්ඩින් අමුද්‍රව්‍ය වැනි අමුද්‍රව්‍ය ආසන්නතම ආයතන මඟින් අත්තිකාරම් මුදල් ලබා ගෙන මිලදී ගනු ලැබේ. | රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු, පලාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශයට අයත් මෙම අමුද්‍රව්‍ය තොගය නියමිත පරිදි ලේඛණගත කර ශේෂ තහවුරු කරගැනීමට කටයුතු කල යුතු බව. |

## 4. මානව සම්පත් කළමනාකරණය

2023 දෙසැම්බර් 31 දිනට අනුමත, තත්‍ය, පුරප්පාඩු කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.88,317,269 ක් වැයකර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.276,857 ක් වී තිබුණි.

| මට්ටම | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු / (අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යෝෂ්ඨ මට්ටම | 31 | 17 | 14 |
| තෘතියික මට්ටම | 10 | 02 | 08 |
| ද්විතියික මට්ටම | 282 | 131 | 151 |
| ප්‍රාථමික මට්ටම | 446 | 169 | 277 |
| **එකතුව** | **769** | **319** | **450** |

තනතුරු 450ක පුරප්පාඩු පිරවීමට හෝ අවශ්‍යතාවයන්ට අනුව තනතුරු සංඛ්‍යාව සංශෝධනය කරගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.